# සැදැහැවත් පවට ලජ්ජා බිය ඇති නුවණැති සැමියා නොඉක්මවා හැසිරෙන කාන්තාව සුගතිගාමී වෙයි

## අනතිචාරී සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, සංයුක්ත නිකාය 4 - පිටු අංක 462- 463)

දහම් පහකින් යුත් කාන්තාව මරණින් පසු සුගති සංඛ්‍යාත දිව්‍ය ලෝකයන්හි උපදින්නීය.

කවර දහම් පහකින් ද යත්;

1. ශ්‍රද්ධාවන්ත වෙයි.
2. පවට ලජ්ජා ඇත්තේ වෙයි.
3. පවට බිය ඇත්තේ වෙයි.
4. සිය සැමියා නොඉක්මවා හැසිරෙන්නියක් වෙයි.
5. ප්‍රඥාවන්ත වෙයි.

මේ දහම් පහෙන් යුතු කාන්තාව මරණින් පසු සුගති සංඛ්‍යාත දිව්‍ය ලෝකයන්හි උපදින්නීය.